# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

## ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

## ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) මගින් අරමුදල් සපයනු ලබන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයාමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) මගින් අරමුදල් සපයනු ලබන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) යටතේ වනු ඇත. ස්ථාවර කිරීමේ කටයුතු සෑම නායයෑම් අවදානම සහිත සෑම දිස්ත්‍රික්කයකම සිදුකරනු ලැබේ.

### 1. (අ) ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ විශේෂඥ (PS 03) (තනතුරු 01)

**තනතුරේ වගකීම් සාරාංශය :**

හැකිලීම්/ සංකෝචන වැඩස්ථානවල හා අවට වැඩ බිම්වල ප්‍රදේශයන්හි විවිධ පුද්ගලයන් සහ සමූහයන් මත ඇතිවන සමාජීය බලපෑම්වල ආවේග පරීක්ෂා කිරීම/ හඳුනා ගැනීම කෙරෙහි වගකීම් භාරය දැරිය යුතු වන අතර, එම අවදනම් සහගත බව තුරන් කරලීම හෝ පාලනය කිරීම සඳහා නිර්දේශිත ස්ථාවර කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කරලීමේ වගකීම ද දරනු ඇත.

### (ආ) ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය හා ආරක්ෂක විශේෂඥ (PS 03) - (තනතුරු 01)

**තනතුරේ වගකීම් සාරාංශය**

නායයාම් අවදානම අවම / ස්ථාවර කිරීමේ වැඩ කටයුතු ඉදිකිරීම් වැඩ බිම්වල සෞඛ්‍ය හා ආරක්ෂණ අවශ්‍යතාවයන් කළමනාකරණය කිරීමේ වගකීම් භාරය දැරිය යුතුය.

**අවම සුදුසුකම් හා පළපුරුද්ද**

✠ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සුදුසුකමක්.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත්, සමාන වෘත්තීයවේදී සුදුසුකමක් / ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම සමග, කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 12ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**හෝ**

(ආ) ඉහත සඳහන් සුදුසුකම් හා අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීයවේදී සුදුසුකමක් හෝ ආයතනික / වරලත් සාමාජිකත්වය හිමිව සිටීම සමග කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 09 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**හෝ**

(ඇ) රජයේ දීප ව්‍යාප්ත සේවයේ 1 ශ්‍රේණිය හි නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරිනියකු වීම සමග 1 වන පංතියේ තනතුරක අඩුම තරමින් වසර 04 ක පළපුරුද්ද.

### 2. ව්‍යාපෘති ගණකාධිකාරී (PS 04) තනතුරු 01

**තනතුරේ වගකීම් සාරාංශය**

ආයතනයේ සියලු ගෙවීම් කටයුතු සහ එහි ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම් ආයතනයේ මූල්‍ය රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයනට අනුකූලව සිදුවන බව තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍යමය වාර්තාකරණ කටයුතු පිළිබඳ වගකීම් භාරය දැරීම.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) විශ්වවිද්‍යාල කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ගණකාධිකරණය සහ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

ගිණුම්කරණය හා මූල්‍ය කටයුතු පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සුදුසුකමක්.

**හෝ**

ගිණුම්කරණය සහ මූල්‍ය කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක් වෙතින් ලබාගත් එහි ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 ක (අටක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**හෝ**

(ආ) රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II පංතියේ හෝ ඉහළ පංතියක නිලධාරීවරයෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක් දරා සිටීම සමග අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 (අටක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

### 3. (අ) පාරිසරික නිලධාරී (PS 06) තනතුරු 01

**තනතුරේ වගකීම් සාරංශයː**

සෞඛ්‍ය ආරක්ෂණ සහ පාරිසරික අවදානම් කළමනාකරණය හෝ වළක්වා ගැනීම හෝ අවම කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පාරිසරිකඥයා / නිලධාරියා හට සහය වීම නායයාම් අවම කිරීම/ ස්ථාවර කිරීම පිළිබඳ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩබිම් සඳහා, පාරිසරික නිවාරණ ක්‍රියාපටිපාටි සූත්‍රගත කර සකස් කිරීම කෙරෙහි වගකීම් භාරය දැරිය යුතු වෙයි.

### (ආ) ප්‍රමාණ සමීක්ෂක (PS 06) තනතුරු 02

**තනතුරේ වගකීම් සාරාංශය** :

මෙම ව්‍යාපෘතිය යටතේ හට ගැනෙන බැවුම් ඍජුකාරක / තිරවද්‍ය කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පශ්චාත් සංකෝචන / හැකිලීම් පිළිබඳ ප්‍රමාණ සමීක්ෂණ වැඩ කටයුතු පූර්ව – සංකෝචන/ හැකිලීම් පිළිබඳ ප්‍රමාණ සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණයට හා කළමනාකරණය කිරීම සඳහා සහය වීම අරහයා ප්‍රසම්පාදන විශේෂඥවරයා හටසහ ප්‍රසම්පාදන ඉංජිනේරුවන් හට සහාය දැක්වීමේ වගකීම් භාර දැරිය යුතුය.

**අවම සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදනන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් හෝ ඊට සමාන සුදුසුකමක්.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීයවේදී අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයක් මගින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර තුනක (03) ක පළපුරුද්ද **හෝ**

(ආ) අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද NVQ (ජාතික වෘත්තීය කුසලතා) 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්ද සමග අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 ක (අටක) සමග පළපුරුද්ද. **හෝ**

(ඇ) අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘත්තීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික / කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ NVQ (ජාතික වෘත්තීය කුසලතා) 5 (පහ) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ වෙනත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛවල ප්‍රතිපාදන/ විධිවිධානවලට යටත්ව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

බඳවා ගැනීම්, මූලිකව එක් වසරක කොන්ත්‍රාත් පදනම මත සිදුකරනු ලබන අතර. ඉන් අනතුරුව සතුටුදායක කාර්ය සාධනයට යටත්ව වාර්ෂිකව දීර්ඝ කරනු ලැබිය හැකිය.

සේ. අ. අ. (EPF) 12% සහ සේ. නි. භා. අ. (ETF) 3% වශයෙන් සංවිධානය විසින් සිදුකරනු ලබන දායකත්වයක් සඳහා හිමිකම් ලබනු ඇත.

2021.02.24 වන දිනට, වයස අවුරුදු 60 ට (හැටට) අඩු විය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ප්‍රකාශ සමග, අදාළ සහතිකවල පිටපත්ද සහිතව 2021 මාර්තු මස 08 වන දිනට හෝ ඉන් පෙර පහත සඳහන් අය වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කරුණාකර අයදුම්කරන තනතුර සහ පුරප්පාඩු RLVMMP/NBRO/2021 යන්න ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නාය යාමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**